# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2202/10 - 2020 නොවැම්බර් මස 18 වැනි බදාදා - 2020.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/1947 (V)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "කොළවෙනිගම රජමහා විහාර ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "කොළවෙනිගම රජමහා විහාර ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ (පා.ම.),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2020 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

1A - G 33213 — 40 (2020/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

කොළවෙනිගම රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය

සර්වේයර් ජනරාල්ගේ 2019 ජූලි මස 8 වන දින අංක MR/KTP/2019/382 දරන අනුරේඛනයේ නිරූපිත දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ, කොළවෙනිගම ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 2.2419ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය ඃ

කැබලි අංක ඃ A

| | | |
|---|---|---|
| උතුරට | ඃ | කුඹුර සහ ගිං ගඟ ; |
| නැගෙනහිරට | ඃ | ගිං ගඟ සහ කුඹුර ; |
| දකුණට | ඃ | කුඹුර ; |
| බටහිරට | ඃ | කුඹුර සහ මාර්ගය (මා.සං.අ). |

11 - 33213/1

---

එල්. ඩී. බී. 94/1947 (V)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මේ නියමය මඟින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන "බිංගිරිය දේවගිරි රජමහා විහාර භූමි ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "බිංගිරිය දේවගිරි රජමහා විහාර භූමි ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ (පා.ම.),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2020 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බිංගිරිය දේවගිරි රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය

සර්වේයර් ජනරාල්ගේ 2018 නොවැම්බර් මස 12 වන දින අංක Ku/BNG/2018/474 දරන අනුරේඛනයේ නිරූපිත වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කීණියම කෝරළේ, සුළු කොට්ඨාසයේ, විහාරගම ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 10.3958ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය ඃ

කැබලි අංක ඃ A

| | | |
|---|---|---|
| උතුරට | ඃ | බිංගිරිය දේවගිරි රජමහා විහාරය හිමිකම් කියන විහාරගම ; |
| නැගෙනහිරට | ඃ | බිංගිරිය දේවගිරි රජමහා විහාරය හිමිකම් කියන විහාරගම සහ ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය හිමිකම් කියන විහාරගම ; |
| දකුණට | ඃ | මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ බිංගිරිය දේවගිරි රජමහා විහාරය හිමිකම් කියන විහාරගම ; |
| බටහිරට | ඃ | බිංගිරිය දේවගිරි රජමහා විහාරය හිමිකම් කියන විහාරගම. |

11 - 33213/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.